# කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය හා ඒ මත ලබාදුන් පොළි සහනාධාර පිළබද කාර්යසාධන විගණන වාර්තාව

**ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව**

**2010**



**කාර්යසාධන හා පරිසර විගණන ඒකකය**

**2013**

**ජුනි**

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**

# ***පටුන***


| | | *පිටුව* |
|---|---|---|
| 1. | විධායක සාරාංශය | 3-4 |
| 2. | හැඳින්වීම | |
| | 2.1 අරමුණු | 5 |
| | 2.2 විගණනය තෝරා ගැනීමට හේතු | 6 |
| | 2.3 විගණන විෂය පථය | 6 |
| | 2.4 විගණන නිර්නායක | 6 |
| 3. | විගණන සොයා ගැනීම් හා නිර්දේශ | 7 |
| | 3.1 පොදු නිරීක්ෂණ | 7-12 |
| | 3.2 සහභාගිත්ව මූල්‍ය ආයතනවල කාර්යසාධනය | 12-18 |
| | 3.3 අධීක්ෂණ නියෝජිතායතනවල කටයුතු පිළිබඳ නිරීක්ෂණ | 18-22 |
| 4. | නිගමනය | 23 |
| | ඇමුණුම - 1 කෘෂි පශු සම්පත් යෝජනා ක්‍රමය පිළිබඳව | 24-25 |
| | ඇමුණුම - 2 විගණනය පිළිබඳ වැඩිමනත් තොරතුරු | 26 |
| | *ඇමුණුම - 3 කාර්යසාධන විගණනය සිදු කිරීමේදී සීමාවන්* | *27* |

# 1. විධායක සාරාංශය

ශ්‍රී ලංකාවේ දියර කිරි සැකසීමේ හා භෝග සැකසීමේ කර්මාන්ත සංවර්ධනයට සහාය දීම සහ කුඩා ගොවීන්ගේ කෘෂි හා කිරි පට්ටි සංවර්ධන ව්‍යාපෘති සඳහා මූල්‍යයනය කිරීම තුලින් බල ගැන්වීමට , රජය කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය 2008 වර්ෂයේදී හඳුන්වා දෙන ලදී. ඊට සමගාමීව,2008 පෙබරවාරි 08 දින පැවැත්වූ රැස්වීමේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කරන ණය මත පොළී සහනාධාරයක් ලබා දීමට තීරණය කර තිබුණි.

කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ ආර්ථිකබව, කාර්යක්ෂමබව හා ඵලදායීබව නිගමනය කිරීමට විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් කාර්ය සාධන විගණනයක් කරන ලදී. කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයට සහභාගී වූ ආයතනවල විවිධ නිලධාරීන් හා බිම් මට්ටමේ අවසාන ප්‍රතිලාභීන් මුණ ගැසීම විගණන ක්‍රියාවලියට ඇතුළත් විය.

*විගණනයේ අරමුණු වූයේ නව රැකියා අවස්ථා බිහිකිරීම තක්සේරු කිරීම, කිරි හා භෝග සැකසීමේ කටයුතු සඳහා ණය ප්‍රදානය කිරීමේ ප්‍රගතිය විමසා බැලීම, කිරි ගොවීන්ට ඔවුන්ගේ ව්‍යාපාර තිරසාරව පවත්වා ගැනීමට නව තාක්ෂණය යොදා ගැනීමට විවෘත වූ මාර්ග පිළිබඳ තක්සේරු කිරීම සහ යැපුම් මට්ටමේ සිට වාණිජ මට්ටමේ ගොවිතැන දක්වා මාරුවීමට ණය යෝජනා ක්‍රමය මගින් ගොවීන්ට ලබාදුන් අවස්ථා හා පිරිවැය ඵලදායිත්වය අගය කිරීමය. ණය යෝජනා ක්‍රමය යටතේ ගොවිපල කටයුතුවල ඵලදායිත්ව වර්ධනයන් තක්සේරු කිරීම හා ණය පොළී සහනාධාර යෝජනා ක්‍රමය හා කෘෂි හා පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයට එයින් වූ දායකත්වය තක්සේරු කිරීම ද ඊට ඇතුළත් වේ.*

විගණනය තුලින් කරන ලද නිරීක්ෂණ සාරාංශ කර පහත දැක්වේ.

(අ) ඉකුත් වර්ෂවල රටේ කිරි නිෂ්පාදනය ඉහළ ගොස් තිබුණි. කෙසේ වෙතත්, කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය හඳුන්වා දීමත් සමඟ කිරි පිටි ආනයන ප්‍රමාණය සුළු වශයෙන් පහළ වැටී තිබුණි.

(ආ) කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ තුන් අවුරුදු කාල සීමාවෙන් පළමු වර්ෂ එක හමාර තුළ, රු.මිලියන 5,000 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 21.45 ක් පමණක් උපයෝජනය කර තිබීමෙන් යෝජනා ක්‍රමය සැලසුම් කළ පරිදි ඵලදායී වී නොතිබුණි.

(ඇ) කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය තුලින් බිහි කිරීමට අපේක්ෂිත නව රැකියා අවස්ථාවන් අවම මට්ටමක පැවතීම.

(ඈ) යෝජනා ක්‍රමයේ අපේක්ෂිත ප්‍රතිලාභයන්ගෙන් එකක් වූ නව ගොවිපල පරිචයන් පිළිබඳ තාක්ෂණික දැනුම, ගොවීන් වෙත ඵලදායී ලෙස මාරු වී නොතිබුණි.

(ඉ) අධීක්ෂණ හා සහභාගීත්ව ආයතන අතර සම්බන්ධීකරණය සැලසුම් කළ පරිදි සිදු වී නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් සලසා තිබුණු අරමුදල් ඵලදායී ලෙස උපයෝජනය

කිරීම සඳහා කෘෂි - පශු සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ කටයුතු කිරි ගොවීන් අතර ජනප්‍රිය වී නොතිබුණි.

2008 අයවැය මගින් යෝජනා කළ පරිදි රටේ කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා රජය විසින් ගනු ලැබූ උත්සාහයට, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කළ කෘෂි - පශු සංවර්ධන ණය යෝජනා ක්‍රමය එක්තරා දුරකට උපකාරී වී තිබුණි. තවද යෝජනා ක්‍රමය ඵලදායීව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට සලසා තිබුණු අරමුදල් ආර්ථිකමය ලෙස යොදා ගැනීමට හැකිවන පරිදි ආයතනික සහයෝගිතාවය නොලැබීම හේතුවෙන් රටේ කුඩා පරිමාණ ගව පට්ටි කර්මාන්තයේ සාර්ථකත්වය සහ කිරි නිෂ්පාදනය වැඩි කිරීමට ණය යෝජනා ක්‍රමය උපරිම මට්ටමට දායක වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

**නිගමනය**

ජාතික හා ප්‍රාදේශීය මට්ටමෙන් වෙනත් විවිධ ආයතන විසින් ක්‍රියාත්මක කළ වෙනත් සමගාමී ව්‍යාපෘති හේතුවෙන්, රටේ දියර කිරි නිෂ්පාදනය දියුණු කිරීම සඳහා කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ බලපෑම විගණනයේදී නිශ්චිතව නිගමනය කිරීමට නොහැකි විය. තවද, සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය, සමහර දිස්ත්‍රික්කවල යථාපරිදි ක්‍රියාත්මක කර තිබුණු අතර සමහර දිස්ත්‍රික්කවල වෙනත් සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් කෘෂි - පශු සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ අරමුණු ළඟාකර ගෙන නොතිබුණි. කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ වූ නිලධාරීන්ගේ අත්දැකීම් හුවමාරුව සඳහා සහ ප්‍රාදේශීය මට්ටමේදී සත්‍ය ගැටලු අවබෝධ කර ගැනීම සඳහා වැඩි අවධානයක් දෙමින් පශු සම්පත් ක්ෂේත්‍රයේ සියළු ආයතන සම්බන්ධීකරණය කිරීමට නිශ්චිත ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සිදුකල යුතු බව නිගමනය කරනු ලැබේ.

# 2. හැඳින්වීම

කුඩා ගොවීන්ගේ කෘෂි හා ගව පට්ටි සංවර්ධන ව්‍යාපෘති සඳහා මූල්‍යනය කිරීම බලගැන්වීමට සහ රට සමගාමීව ශ්‍රී ලංකාවේ දියර කිරි සැකසීමේ හා භෝග සැකසීමේ කර්මාන්තය සංවර්ධනය සඳහා සහායවීමට 2008 වර්ෂයේදී රජය විසින් කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. 2008 පෙබරවාරි 08 දින පැවති ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ රැස්වීමේදී කෘෂි - පශු සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කල ණය මත පොලී සහනාධාර ලබාදීමටද තීරණය කර තිබුණි. පශු සම්පත් සංවර්ධන කටයුතුවල සක්‍රීය ලෙස නිරත වන පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යාප්ති නිලධාරීන්ට දිරි ගැන්වීමේ දීමනාවක් වර්ෂ දෙකක කාලයක් සඳහා ප්‍රතිපත්ති ප්‍රෝත්සාහක අරමුදලක්ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිහිටුවා තිබුණි. ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට බලපත්‍රලාභී බැංකු 14 ක් ණය ආයතන වශයෙන් සහභාගි කර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව පියවර ගෙන තිබුණි.

## 2.1 අරමුණු

මෙම කාර්ය සාධන විගණනයේ අරමුණු පහත දැක්වේ.

(අ) ණය යෝජනා ක්‍රමය යටතේ උත්පාදනය කළ නව රැකියා අවස්ථාවන් තක්සේරු කිරීම.

(ආ) කිරි හා භෝග සැකසීමේ කටයුතු සඳහා ප්‍රදානය කල මධ්‍යකාලීන ණය පිළිබඳ ප්‍රගතිය තක්සේරු කිරීම.

(ඇ) නව තාක්ෂණය යොදා ගැනීමට හා ඔවුන්ගේ ව්‍යාපාර තිරසාරව හා පිරිවැය ඵලදායී ලෙස යොදා ගැනීමට ගව පට්ටි ගොවීන් සඳහා විවෘත වූ මාර්ග තක්සේරු කිරීම.

(ඈ) යැපුම් මට්ටමේ ගොවිතැන් කටයුතු වල සිට වාණිජ මට්ටමේ ගොවිතැන් වලට ගොවීන් මාරුවීමට ණය යෝජනා ක්‍රමය විසින් උදාකල අවස්ථා තක්සේරු කිරීම.

(ඉ) ණය යෝජනා ක්‍රමය යටතේ වර්ධනය වූ ගොවිතැන් කටයුතුවල ඵලදායීතාවය තක්සේරු කිරීම.

(ඊ) ණය පොලී මත සහනාධාර යෝජනා ක්‍රමයේ ප්‍රගතිය සහ කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ සාර්ථකත්වයට එහි දායකත්වය තක්සේරු කිරීම.

2008 මාර්තු 01 දිනෙන් ආරම්භ වී 2010 ජූනි 30 දිනට ව්‍යාපෘති කාලයෙන් සියයට 50 ක් සම්පූර්ණ කල කාලසීමාව පමණක් විගණනයෙන් ආවරණය විය.

## 2.2 විගණනය තෝරා ගැනීමට හේතු

කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ ඵලදායිත්වය තක්සේරු කිරීමට හා යෝජනා ක්‍රමය විසින් උපයෝජනය කළ අරමුදල්වල ආර්ථිකමය හා කාර්යක්ෂමතාවය අගය කිරීම පිණිස කාර්යසාධන විගණන නිර්නායක යටතේ විගණනයක් සිදු කිරීමට කෘෂි - පශු සංවර්ධන ණය යෝජනා ක්‍රමය තෝරා ගන්නා ලදී.

## 2.3 විගණන විෂය පථය

මෙම කාර්ය සාධන විගණනය, උත්තර්තර විගණන ආයතනයන්හි ජාත්‍යන්තර සංවිධානය (උ.වි.ආ.ජ්‍යා.සං.) විසින් නිකුත් කරන ලද කාර්ය සාධන විගණන මඟපෙන්වීම්වලට අනුව සිදු කරන ලදී. එම ප්‍රමිතීන් අනුව ණය යෝජනා ක්‍රමයේ අරමුණු ඉටුකර ගැනීම, එම අරමුණු ඉටුකර ගැනීමට සම්බන්ධ අවදානම තීරණය කිරීම, සොයා ගැනීම් මත නිගමනයන් හා ඒ මත නිර්දේශයන් සිදු කිරීමට පදනමක් වශයෙන් ආයතනය, එහි මෙහෙයුම් සහ අභ්‍යන්තර පාලන පද්ධතීන් පිළිබඳ අවශ්‍ය ප්‍රමාණයට විගණන අවබෝධය ලබාගත යුතුවේ.විගණන අවදානම තක්සේරු කිරීමේ ප්‍රතිඵලය මත විගණන ක්‍රියාමාර්ගවල ස්වභාවය හා ප්‍රමාණය වෙනස් වේ. සොයා ගැනීම් හා නිගමනයන්ට උපකාර වන සාක්ෂි රැස් කිරීම සහ පරීක්ෂා කිරීම අපගේ ක්‍රියාමාර්ග වලට ඇතුළත් විය. සාධාරණ නිගමනයට එළඹීමට හැකිවන පරිදි ප්‍රමාණවත් යැයි අප තීරණය කරන ප්‍රවීන විගණන සාක්ෂි ලබා ගන්නා ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ කාර්ය සාධන විගණනයක් කරන ලදී.

## 2.4 විගණන නිර්නායකයන්

- කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළ කාලය තුළ සහ ඊට පෙර තෝරාගත් ප්‍රදේශය/දිස්ත්‍රික්කය තුළ පැවති සේවා නියුක්ති අවස්ථා ගණන තීරණය කිරීම.
- ප්‍රදානය කිරීමට අපේක්ෂා කළ ණය ප්‍රමාණය හා 2010 ජූනි 30 දිනට ඉටුකල ප්‍රමාණය තීරණය කිරීම.
- කිරි ලබා ගැනීම්, ශීත කිරීම් හා ආහාර සැකසුම් කටයුතු සඳහා නව තාක්ෂණය යොදා ගත් ප්‍රතිලාභීන් ප්‍රමාණය තීරණය කිරීම.
- ගවහල් ඉදිකිරීම, දෙනුන්/වැස්සියන් මිළදී ගැනීම සහ කිරි දෙවීම් කටයුතු හා ශීතාගාර සඳහා යන්ත්‍ර යනාදිය මිළදී ගැනීම සිදුකළ ගොවීන් සංඛ්‍යාව තීරණය කිරීම.
- කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පෙර හා පසු නිෂ්පාදනය කල කිරි ප්‍රමාණය තීරණය කිරීම.
- සහභාගිත්ව මූල්‍ය ආයතන/ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහා භාණ්ඩාගාරයෙන් අයදුම් කළ පොළී ප්‍රමාණය තීරණය කිරීම.

# 3. විගණන නිරීක්ෂණ හා නිර්දේශ

## 3.1 පොදු නිරීක්ෂණ

### 3.1.1 කිරි නිෂ්පාදනය සම්බන්ධ කරුණු

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව, ශ්‍රී ලංකාවේ දේශීය කිරි නිෂ්පාදනය පසුගිය කාලය තුල වර්ධනය වී තිබුණි. පිටි කිරි ආනයනයද සුළු වශයෙන් පහත වැටී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | මුළු වාර්ෂික නිෂ්පාදනය | කිරිපිටි | |
|---|---|---|---|
| | | දේශීය නිෂ්පාදනය | ආනයන |
| | (ලීටර්' 000) | (මෙට්‍රික් ටොන් '000) | (මෙට්‍රික් ටොන් '000) |
| 2007 | 202,009 | 7.00 | 68.1 |
| 2008 | 208,093 | 7.24 | 61.6 |
| 2009 | 233,316 | 7.53 | 61.51 |

කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයට අමතරව, කෘෂි- පශු සම්පත් අංශයෙන් නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා විවිධ වර්ගයේ සංවිධාන විසින් වැඩ සටහන් ගණනාවක් ක්‍රියාත්මක කරනු ලබයි. යෝජනා ක්‍රමය හා සමගාමීව මෙහෙයවනු ලැබ තිබුණු විගණනයේදී නිරීක්ෂණය වූ එවැනි වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

- සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, රටේ කිරි නිෂ්පාදනය වැඩි කිරීමට හා කිරි ගොවීන් වෙත අභිජනනය කල සතුන් සැපයීමේ කාර්යය සඳහා කිරි ගොවීන්ගේ ගම්මාන වැඩ සටහන් (කිරි ගොවි ගම්මාන) ක්‍රියාත්මක කර තිබුණි.
- වයඹ පළාතේ කිරි ගොවීන් ගොවිපල තුළින් ස්වයං රැකියා අවස්ථාවන් උත්පාදනය කිරීම සඳහා වයඹ පළාත් සභාව ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණි.
- පොල් වගාකරුවන් ගව පට්ටි පාලන කටයුතු වලට උනන්දු කිරීම සහ පොල් උද්‍යාන සඳහා කාබනික පොහොර ඵලදායීව යොදා ගැනීමට සඳහා ගවහල් ඉදිකිරීමේ පිරිවැය ප්‍රතිපූර්ණය කිරීමේ සහනාධාර යෝජනා ක්‍රමයක් පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් කුරුණෑගල, පුත්තලම, ගම්පහ සහ මාතලේ දිස්ත්‍රික්කවල 2008 වර්ෂයේදී දියත් කර තිබුණි.

ගව පට්ටි හිමියන්ට දියර කිරි අලෙවිය ප්‍රධාන ගැටලුවක් වී නොතිබුණි. ගොවි හදවත් දිනා ගැනීම සඳහා මහා පරිමාණ කිරි සැකසුම් සමාගම් තරඟයක යෙදී සිටී අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ගොවීන්ට ඔවුන්ගේ කිරි නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබා ගැනීමට හැකි වී තිබුණි. රජයට අයත් මිල්කෝ සමාගම ගව පට්ටි ගොවීන් වෙත, සමිති පිහිටුවීමට සහයෝගය ලබාදෙමින් ව්‍යාප්ති සේවා,

ණය පදනම මත තණකොළ හා බෙහෙත් ද්‍රව්‍ය සැපයීම වැනි වෙනත් පහසුකම් ද ලබාදෙමින් ගනුදෙනුකරුවන් රාශියක් සමාගම සතු කරගෙන තිබුණු බව නිරීක්ෂණය විය.
බහු ජාතික සමාගමක් ඇතුළත් වෙනත් පෞද්ගලික සමාගම් ගොවීන් යොමු කර ගැනීම සඳහා මිල්කෝ සමාගමට වඩා සුළු වශයෙන් වැඩි මිලක් ඉදිරිපත් කර තිබුණත් වෙනත් පහසුකම් සපයා නොතිබුණි.

***බලපෑම***

රටේ කිරි නිෂ්පාදනය පසුගිය කාල සීමාව තුළ කැපීපෙනෙන ලෙස වර්ධනය වී තිබුණ ද එම වැඩිවීම සම්බන්ධයෙන් කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය විසින් ඇති කරන ලද බලපෑම හේතු වී ඇති බවට නිගමනය කිරීම අපහසු විය. සමාන ණය හා සහනාධාර යෝජනා ක්‍රම ක්‍රියාත්මකව පැවති අතර සමහර රජයේ සහ වෙනත් ආයතන කිරි නිෂ්පාදනය වැඩි කිරීමට දායකත්වය ලබාදී තිබුණි. සමාන සහනාධාර සපයන ආයතන අතර සම්බන්ධීකරණයක් නොවීම හා වැඩසටහන්/යෝජනා ක්‍රම සම්බන්ධ සංඛ්‍යා ලේඛන එක් වරම ලබා ගැනීමට නොහැකිවීම යන කරුණු හේතුවෙන් රටේ පශු සම්පත් සංවර්ධනය පිළිබඳ කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයෙන් වූ බලපෑම පිළිබඳ තක්සේරු කිරීම ඵලදායී වී නොතිබුණි.

***නිර්දේශ***

(අ) පළාත් සභා ඇතුළත්ව රාජ්‍ය අංශයේ වෙනත් ආයතන විසින් රටේ කිරි ගොවිපල සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරනු ලැබූ වෙනත් වැඩ සටහන් සමඟ කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය සම්බන්ධ කිරීම, එකම ගොවියෙකු වෙත විවිධ මූලාශ්‍ර වලින් හා විවිධ ක්ෂේත්‍ර සංවිධාන විසින් කිරි ගොවිපල සඳහා ලබා දෙන සහනාධාර හා පහසුකම් වෙනුවෙන් වැය කරන පිරිවැය හා පරිශ්‍රමය ඉතිරි කර ගැනීමට මේ මගින් හැකිවේ.

(ආ) මිල්කෝ සමාගම ඇතුළුව කිරි සැකසීමේ සමාගම්වල ක්ෂේත්‍ර නිලධාරීන් කිරි එකතු කිරීමේ කටයුතු වලට සක්‍රියව සම්බන්ධ වන හෙයින් ඔවුන්ගේ ගනුදෙනුකරුවන් අතර කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ කටයුතු ව්‍යාප්ත කිරීමට කිරි සැකසීමේ සමාගම්වල සහයෝගය ලබා ගැනීම. මෙය කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය පුළුල් පරිමාණයෙන් ජනප්‍රිය කරවීම සඳහා ඵලදායී ප්‍රචාරණ මාර්ගයක් වන අතර එය අදාල සියළු පාර්ශවයන්ගේ පිරිවැය අවම කිරීමට හේතුවනු ඇත.

***නියෝජ්‍ය ආයතනවල ප්‍රතිචාරය***

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිචාරය අනුව ඵලදායී ලෙස පහසුකම් ව්‍යාප්ත කිරීම පිණිස කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය කටයුතු වෙනත් ආයතන සමඟ සම්බන්ධ කිරීමට එකඟ වී ඇත.

ආරම්භක අවධියේදී කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය ගොවීන් අතර ජනප්‍රිය කිරීම සඳහා මිල්කෝ සමාගමේ සහයෝගය ශ්‍රී ලංකා මහ බැංකුවට ලැබී තිබුණි. කෙසේ වෙතත්, දැනට මිල්කෝ සමාගම ස්වාධීනව තම සාමාජිකයින් හා ගොවීන් අතර පශු සම්පත් සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කරන අතර ඒ අනුව කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයද ප්‍රවර්ධනය කරනු ලබයි.

### 3.1.2 කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ කටයුතුවල ප්‍රගතිය සම්බන්ධ කරුණු

කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ 2008 මාර්තු 01 දින සිට ක්‍රියාත්මකවූ වර්ෂ තුනක කාලය තුළ කිරි ගොවීන් සඳහා වැය කිරීමට අපේක්ෂාකල මූල්‍ය ඉලක්කය රු.මිලියන 5,000 ක් වුවත් 2010 ජූනි 30 දින වන විට ප්‍රදානය කර තිබුණු මුළු ණය ප්‍රමාණය රු.මිලියන 1,072.85 ක් වී තිබුණි. කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ වැය කිරීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| කාර්යය | 2010 ජූනි 30 දිනට ණය ප්‍රමාණය | 2010 ජූනි 30 දිනට මුදල් ප්‍රමාණය රු.මිලියන |
|---|---|---|
| පශු සම්පත් සංවර්ධනය | 6,765 | 633.91 |
| - බලපත්‍රලාභී වාණිජ බැංකු | | |
| රජය සතු | 2,971 | 289.87 |
| පෞද්ගලික | 898 | 84.95 |
| - බලපත්‍රලාභී විශේෂිත බැංකු | | |
| රජය සතු | 2,826 | 252.11 |
| පෞද්ගලික | 70 | 6.98 |
| දියර කිරි සැකසීම | | |
| - බලපත්‍රලාභී වාණිජ බැංකු | 197 | 388.79 |
| රජය සතු | 178 | 360.28 |
| පෞද්ගලික | 14 | 25.83 |
| - බලපත්‍රලාභී විශේෂිත බැංකු | | |
| රජය සතු | 5 | 2.68 |
| පෞද්ගලික | නැත | නැත |
| කෘෂි - සැකසුම් | 45 | 50.15 |
| - බලපත්‍රලාභී වාණිජ බැංකු | | |
| රජය සතු | 41 | 11.57 |
| පෞද්ගලික | 4 | 38.58 |
| - බලපත්‍රලාභී විශේෂිත බැංකු | | |
| රජය සතු | | |
| පෞද්ගලික | නැත | නැත |
| | නැත | නැත |

ඉහත සඳහන් තොරතුරු අනුව රජය සතු බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු බොහොමයක් කුඩා පරිමාණ ගොවීන්ට පශු සම්පත් සංවර්ධනය සඳහා ණය ප්‍රදානය කර තිබුණු අතර පෞද්ගලික බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වාණිජ පදනමක් යටතේ දියර කිරි හා කෘෂි සැකසුම් කාර්යයන් සඳහා ණය ප්‍රදානය කර තිබුණි.

***බලපෑම***

රටේ සමහර දිස්ත්‍රික්කවල කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ සාර්ථකත්වය, සහභාගිත්ව ණය ආයතනවල කැපවීම මත රඳා පැවතුණි. සමහර සංවර්ධන බැංකු සුළු පරිමාණයෙන් ව්‍යාපාර කරනු ලබන කිරි ගොවීන් වෙත කේවල ණය ප්‍රදානය කිරීමට විශේෂ අවධානයක් යොමු කර තිබුණු අතර මහා පරිමාණ කෘෂි - සැකසුම් ව්‍යාපෘති සඳහා ණය ප්‍රදානය කිරීමට වාණිජ බැංකු යොමු වී තිබුණි. යෝජනා ක්‍රමය වෙත සලසා තිබුණු අරමුදල් ඵලදායී ලෙස උපයෝජනය නොකල බව දැක්වෙන අතර මාස 28 ක කාලයෙන් පළමු මාස 7 අවසාන වන විට වැයකල අරමුදල් ප්‍රමාණයෙන් පශු සම්පත් ගොවීන්ට යෝජනා ක්‍රමයේ අපේක්ෂිත ප්‍රතිලාභ අහිමි වී තිබුණි.

***නිර්දේශය***

පශු සංවර්ධන කාර්යයන් හා කිරි/ කෘෂි - සැකසුම් කාර්යයන් වශයෙන් කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය කටයුතු වෙනුවෙන් සලසා තිබුණු අරමුදල් ක්‍රමානුකූලව වැය කිරීම තහවුරු වන පරිදි එම ණය පිළිවෙලින් සංවර්ධන බැංකු හා වාණිජ බැංකු මාර්ගයෙන් ප්‍රදානය කිරීම් ඵලදායී වේ.

***නියෝජිතායතන ප්‍රතිචාරය***

ශ්‍රී ලංකා මහ බැංකුවට අනුව 2012 ජුනි 30 දිනට තත්ත්වය පහත පරිදි වේ.

| කාර්යය | ණය ප්‍රමාණය | ප්‍රදානය කල මුදල රු.මිලියන |
|---|---:|---:|
| පශු සම්පත් සංවර්ධනය | 13,686 | 1,688 |
| දියර කිරි සැකසුම | 451 | 594 |
| කෘෂි සැකසුම් | 56 | 105 |
| **එකතුව** | **14,193** | **2,386** |

ශ්‍රී ලංකා මහ බැංකුවට අනුව, ණය ගැණුම්කරුවන්ට තමන්ගේ බැංකුව තෝරා ගැනීම සඳහා අවස්ථාවක් ලබාදීම වැදගත් කරුණක් වන බැවින් වාණිජ බැංකු හා සංවර්ධන බැංකු වලට ව්‍යාපෘතිය වෙන් කිරීම අපහසු කරුණක් වේ. සංවර්ධන බැංකු පමණක් සුළු ගොවීන්ගේ අවශ්‍යතා සපුරන ලද බවට වූ තර්කය තහවුරු කිරීමට සමුච්චිත දත්ත උපකාරයක් වී නොතිබුණි.

### *3.1.3 නව රැකියා අවස්ථා නිර්මාණය කිරීම හා නව තාක්ෂණය හුවමාරු කිරීම*

(අ) ආරම්භක අවස්ථාවේදී, කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ නව රැකියා අවස්ථා සම්බන්ධ ඉලක්ක දක්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. ණය යෝජනා ක්‍රමය සම්බන්ධ තොරතුරු රැස්කර ගැනීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ කාලය තුළ ප්‍රමිති ගත ප්‍රශ්නාවලියක් යොමු කරන ලද අතර කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය යොදාගත් කාර්යය සම්බන්ධයෙන් වූ ප්‍රශ්නයක් සඳහා ගොවීන් 67 ක් අතුරින් ගොවීන් 61

දෙනෙකු අදාල ණය මුදල ව්‍යාපාර ආරම්භක කිරීමට යොදා නොගෙන පවත්නා ව්‍යාපාර පුළුල් කිරීම සඳහා යොදාගත් බව පිළිතුරු වශයෙන් සඳහන් කර තිබුණි. ඒ අනුව කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය මගින් අපේක්ෂිත පරිදි නව රැකියා අවස්ථා ජනනය වී නොතිබුණි.

(ආ) විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී සම්පූර්ණ කරන ලද ප්‍රශ්නාවලිය අනුව, සම්මුඛ සාකච්ඡා කරන ලද ගොවීන් 67 දෙනෙක් අතුරින් ශක්‍යතා අධ්‍යයනය වාර්තා හා මුදල් ප්‍රවාහ පිළියෙල කිරීම සඳහා විශේෂඥ සහාය ලබාගත් ගොවීන් සංඛ්‍යාව 44 දෙනෙකුට සීමා වී තිබුණි. ඉතිරි ගොවීන් ව්‍යාපාරය ආරම්භ කිරීමට කිසිදු විශේෂඥ සහායක් ලබා නොතිබුණු නමුත් බැංකු ණය ලබාගෙන තිබුණි. ඒ අනුව ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු ඵලදායීව හා තිරසාරව මෙහෙයවීමට හැකිවන පරිදි ගොවීන් විසින් නව තාක්ෂණය හුවමාරුකර ගැනීම හෝ එය සැලකිල්ලට ගෙන හෝ නොතිබුණු බව තහවුරු විය.

***බලපෑම***

කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ සාර්ථකත්වය සඳහා බලපෑ කරුණු භූගෝලීය කලාප අනුව වෙනස් වී තිබුණි. උතුරු මැද පළාතේ ගොවීන් ඉහල ගුණාත්මක තත්ත්වයේ අභිජනනය කළ සතුන් ලබා ගැනීම හා වියළි කාලසීමාවලදී තණබිම් නඩත්තු කිරීම වැනි ගැටළු වලට මුහුණ පා තිබුණු අතර කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවීන් නව තාක්ෂණය පරිහරණය හා ගොවිපල සම්බන්ධ ගැටළු වලට මුහුණ පා තිබුණි. එවැනි ගැටළු විසඳා නොගැනීම හේතුවෙන් ගව පට්ටි පාලනය, ස්ථාවර ආදායමක් සහිත ස්ථිර ආදායම් මූලාශ්‍රයක් ලෙස සැලකීමට ගොවීන් පෙළඹී වී නොතිබුණු අතර, ඒ අනුව කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගැනීමටත් ගොවීන් දිරි ගැන්වීම අපහසු වී තිබුණි.

***නිර්දේශ***

(අ) කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ ව්‍යාපෘතීන් අනුමත කරන අවස්ථාවේදී, කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය මගින් උත්පාදනය වන රැකියා අවස්ථාවන් හා ඒවායේ තිරසාරභාවය වැනි කරුණු පිළිබඳව සැලකිලිමත් වන ලෙස සහභාගිත්ව මූල්‍ය ආයතනවල ණය නිලධාරීන් / ව්‍යාපෘති නිලධාරීන් වෙත උපදෙස් ලබාදීම.

(ආ) කිරි ගොවීන් වෙත තාක්ෂණික දැනුම හුවමාරු කිරීමට හා කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ ඵලදායීත්වය තහවුරු කිරීමට උපකාර වන බැවින් කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රම සඳහා ව්‍යාපෘති යෝජනා පිළියෙල කිරීමේදී විශේෂඥ සහාය ලබා ගැනීමට කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ අයදුම්කරුවන් උනන්දු කිරීම.

*නියෝජ්‍යායතන ප්‍රතිචාර*

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලාශ්‍ර අනුව, අදාල ප්‍රදේශවල කිරි ගොවීන් අතර දැනුවත්භාවය ඇති කිරීමට සහභාගිත්ව මූල්‍ය ආයතන සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යන ආයතනවල නිලධාරීන්ට උපදෙස් දී තිබුණි. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව, දෙපාර්ශවයේ උපදේශකත්වයෙන් දිවයින තුළ තෝරාගත් ගොවි කණ්ඩායම් සමග වැඩසටහන් පෙළක් පැවැත්වීය.

## 3.2 *සහභාගිත්ව මූල්‍ය ආයතනවල කාර්යසාධනය*

### 3.2.1 *වයඹ සංවර්ධන බැංකුව (ඩබ්ඩීබී)*

වයඹ සංවර්ධන බැංකුව වයඹ පළාතේ හා ගම්පහ දිස්ත්‍රික්කයේ කටයුතු මෙහෙයවා තිබුණු අතර කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය ආපසු අයකර ගැනීමේ අනුපාතය සියයට 98 ක තරම් සතුටුදායක මට්ටමක පැවතුණි.

වයඹ සංවර්ධන බැංකුව විසින් ක්‍රියාත්මක කළ කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය, සංවර්ධන ණය යෝජනා ක්‍රම දිරිගැන්වීම සඳහා සේවා නියුක්ත කර තිබුණු කාර්යක්ෂම ක්ෂේත්‍ර නිලධාරීන් නිසා සාර්ථක වී තිබුණි. ඔවුන් මූල්‍යමය සහයෝගය අවශ්‍ය වූ සුළු ගොවීන් ඇසුරු කරමින් කිරි නිපදවන්නන්ගේ සමිති සමග යහපත් සම්බන්ධතා පවත්වා තිබුණි. වයඹ සංවර්ධන බැංකුව, අනෙකුත් ඇපකර ලබා ගැනීම වෙනුවට කිරි නිෂ්පාදන සමිති සාමාජිකයින් විසින් ඉදිරිපත් කර තිබුණු පෞද්ගලික ඇපකර මත ණය ප්‍රදානය කර තිබුණු අතර එය ණය ගැනුම්කරුවන්ට පහසුවක් වී තිබුණි.

වයඹ සංවර්ධන බැංකුව ප්‍රධාන වශයෙන් දෙනුන් මිළදී ගැනීම සඳහා ණය ප්‍රදානය කර තිබුණි. කිරි සැකසුම් හා කෘෂිකර්මය පදනම් කරගත් කටයුතු යනාදිය වැනි කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ වෙනත් කටයුතු සඳහා ණය ප්‍රදානය කර නොතිබුණි.

ගවපට්ටි ගොවීන් වැඩි දෙනෙක් ගවගාල් ඉදිකිරීම හෝ ඒවා නිසි ආකාරයෙන් නඩත්තු කර හෝ නොතිබුණි. වයඹ සංවර්ධන බැංකුව විසින් දෙනුන් මිළදී ගැනීම සඳහා ණය ප්‍රදානය කිරීමට පෙර ණය ගැනුම්කරුවන් ගවගාල් ඉදිකර ඇති බව තහවුරු කර ගැනීමට ක්ෂේත්‍ර නිලධාරීන් වෙත උපදෙස් නිකුත් කර නොතිබුණි.

ගවගාල් ඉදිකිරීම සඳහා ප්‍රදානය කරන ලද ණය මුදල් ගොවීන් විසින් අදාල කාර්යය සඳහා ඵලදායී ලෙස උපයෝජනය කර නොතිබුණි. වයඹ සංවර්ධන බැංකුවේ නිට්ටඹුව හා මීරිගම ශාඛා විසින් ගවගාල් ඉදිකිරීම සඳහා ණය ලබාදුන් ගොවීන් හතර දෙනෙකු අතුරින් එක් ගොවියෙක් පමණක් අදාල කාර්යය සඳහා ණය මුදල් උපයෝජනය කර තිබුණි.

***බලපෑම***

(අ) කුරුණෑගල හා ගම්පහ දිස්ත්‍රික්කවල කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ සාර්ථකත්වය, සහභාගිත්ව මූල්‍ය ආයතනවල කැපවීම මත රඳා පැවතුණි. සුළු පරිමාණ ව්‍යාපාර කර ගෙන යනු ලබන කිරි ගොවීන් වෙත කේවල වශයෙන් ණය ලබා දීමට වයඹ සංවර්ධන බැංකුව වැඩි අවධානයක් යොමු කර තිබුණු අතර මහා පරිමාණ කෘෂි - සැකසුම් ව්‍යාපෘති සඳහා ණය ප්‍රදානය කිරීමට සලකා බලා නොතිබුණි.

(ආ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ කිරි නිපදවන්නන්ගේ සමිතිවල දායකත්වය කැපී පෙනෙන උසස් තත්ත්වයක විය. දිස්ත්‍රික්කයේ සහභාගිත්ව මූල්‍ය ආයතන එම සමිති හරහා ණය ප්‍රදානය කර වාරික අයකර ගෙන තිබුණි.

(ඇ) වයඹ සංවර්ධන බැංකුවේ ක්ෂේත්‍ර නිලධාරීන්, ගවගාල් ඉදිකිරීම හා ඒවායේ සෞඛ්‍ය සම්පන්න තත්ත්වය තහවුරු වන පරිදි නඩත්තු කිරීම වැනි යටිතල පහසුකම් වලට අවධානය යොමු කරනු වෙනුවට ප්‍රධාන වශයෙන් ණය ප්‍රදානය කිරීම සඳහා  අවධානය යොමුකර තිබුණි. ඒ අනුව, කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ අරමුණු වලින් කොටසක් පමණක් ඉටුකර ගෙන තිබුණි.

***නිර්දේශය***

(අ) කිරි සැකසුම් හා වෙනත් කෘෂි ව්‍යාපාර කටයුතු සඳහා අරමුදල් අවශ්‍ය වන ණය ගැණුම්කරුවන්හට කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ණය සැපයීමට වයඹ සංවර්ධන බැංකුව උනන්දු කළ යුතුය.

(ආ) ණය මුදල් මුදා හැරීමට පෙර අනුමත ප්‍රමිතීන් මත ගවගාල් පවතින බව පරීක්ෂා කිරීමට ක්ෂේත්‍ර නිලධාරීන් වෙත උපදෙස් දීමට වයඹ සංවර්ධන බැංකුව පියවර ගත යුතුය.

***නියෝජ්‍තායතනයේ ප්‍රතිචාරය***
***ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිචාරය :-***

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශ දෙකම පිළිගන්නා ලදී. ඉහත සඳහන් විෂයයන්ගේ අවශ්‍යතා සම්බන්ධයෙන් වයඹ සංවර්ධන බැංකුවේ, වර්තමාන  ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ක්ෂේත්‍ර නිලධාරීන් වෙත දැනටමත් උපදෙස් දී ඇති අතර ඔවුන් පළාතේ  කිරි ගොවීන් වෙත කාර්යක්ෂම සේවාවන් සපයා තිබුණි. වයඹ සංවර්ධන බැංකුව, වර්තමාන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කාර්යසාධනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සෑහීමකට පත්වී ඇත.

### 3.2.2 *රජරට සංවර්ධන බැංකුව*

ක්ෂේත්‍ර නිලධාරීන්ගේ හිඟයක් සහිතව රජරට සංවර්ධන බැංකුව ක්‍රියාත්මක වී තිබුණි. ඒ අනුව කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ අධීක්ෂණ කටයුතු සතුටුදායක වී නොතිබුණි. කිරි ගොවීන් වැඩි දෙනෙක් නිසි ආකාරයෙන් ගවගාල් ඉදිකර හෝ නඩත්තු කර හෝ නොතිබුණි. රජරට සංවර්ධන බැංකුව විසින් දෙනුන් මිළදී ගැනීම සඳහා ණය ප්‍රදානය කිරීමට පෙර ණය ගැණුම්කරුවන් ගවගාල් ඉදිකර ඇති බව තහවුරු කිරීම සඳහා ක්ෂේත්‍ර නිලධාරීන් වෙත උපදෙස් නිකුත් කර නොතිබුණි.

ණය ගැණුම්කරුවන් අදාල කාර්යය සඳහා ණය මුදල් උපයෝජනය කර නොතිබුණි. නියැදි පරීක්ෂණයෙන් අනාවරණය වූයේ ණය ගැණුම්කරුවන්ගෙන් තුනෙන් දෙකක් ණය මුදල් වෙනත් කාර්යයන් සඳහා යොදවා තිබුණි. කෙසේ වෙතත්, ණය වාරික කලට වේලාවට ගෙවන බැවින් ඔවුන්ට එරෙහිව කිසිදු පියවරක් රජරට සංවර්ධන බැංකුව විසින් ගෙන නොතිබුණි.

***බලපෑම***

කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ අපේක්ෂිත කාර්යයන් ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක වීමේදී රජරට සංවර්ධන බැංකුව සාර්ථක වී නොතිබුණි.

***නිර්දේශය***

(අ) රජරට සංවර්ධන බැංකුව එහි ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සංඛ්‍යාව වැඩිකර ගැනීමට හා අපේක්ෂිත කාර්යයන් ඉටුකර ගැනීම සඳහා කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය.

(ආ) ණය මුදල් මුදාහැරීමට පෙර නිර්දේශිත ප්‍රමිතීන් අනුව ගවගාල් පවතින බව පරීක්ෂා කිරීමට ක්ෂේත්‍ර නිලධාරීන්ට උපදෙස් දීමට රජරට සංවර්ධන බැංකුව පියවර ගත යුතුය.

***නියෝජ්තායතන ප්‍රතිචාර***

***ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිචාරය :-***

නිර්දේශ පිළිගන්නා අතර ක්ෂේත්‍ර නිලධාරීන් වැඩි ප්‍රමාණයක් සේවයේ යෙදවීමේ අවශ්‍යතාවය පිළිගෙන තිබුණි. රජරට සංවර්ධන බැංකුව ඇතුළත්ව සංවර්ධන බැංකු ඒකාබද්ධ කර ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ඇති කර තිබුණි. කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ දන්වා තිබුණු අවශ්‍යතා මත උපදෙස් නිකුත් කිරීමට ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට උපදෙස් දී තිබුණි.

### 3.2.3 *කඳුරට සංවර්ධන බැංකුව*

කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය අයකර ගැනීම සියයට 98 ක සතුටුදායක මට්ටමක පැවතුණි. කඳුරට සංවර්ධන බැංකුව විසින් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ ප්‍රවර්ධනය සඳහා කාර්යක්ෂම ක්ෂේත්‍ර නිලධාරීන් සේවා නියුක්ත කර තිබුණි. මූල්‍ය සහාය අවශ්‍ය වූ සුළු පරිමාණ ගොවීන් සමඟ සම්බන්ධතා පැවැත්වීමට ඔවුන්ට හැකි වී තිබුණි. තවද, කිරි එකතු කිරීමේ සමිති සමඟ යහපත් සබඳතා පැවැත්වීමටත්, ණය වාරික අයකර ගැනීමටත් ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීමටත් හැකි වී තිබුණි.

කෙසේවෙතත්, කඳුරට සංවර්ධන බැංකු ශාඛා වෙත ණය අයදුම් පත් භාරදුන් ගොවීන් 1,208 අතුරින් 2010 සැප්තැම්බර් 08 දින වන විට ණය ලබා දී තිබුණේ ගොවීන් 610 දෙනෙකු වෙත පමණක් බව නිරීක්ෂණය විය.

***බලපෑම***

කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය මහනුවර දිස්ත්‍රික්කයේ සාර්ථකවීමට ක්ෂේත්‍ර නිලධාරීන් විසින් සිදුකල කැප කිරීම හේතු වී තිබුණි. කඳුරට සංවර්ධන බැංකුව විසින් සුළු පරිමාණ ව්‍යාපාරවල නියැලී කිරි ගොවීන් වෙත කේවල වශයෙන් ණය ප්‍රදානය කිරීමට වැඩි අවධානයක් යොමු කර තිබුණු අතර මහා පරිමාණ කිරි සැකසුම් ව්‍යාපෘති එකකට පමණක් ණය ප්‍රදානය කර තිබුණි. ඒ අනුව කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ අරමුණු පූර්ණ වශයෙන් අත් කරගෙන නොතිබුණි.

***නිර්දේශය***

ප්‍රදේශයේ කිරි සැකසුම් ව්‍යාපෘති සඳහා කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය ව්‍යාප්ත කිරීමට කඳුරට සංවර්ධන බැංකුව දිරිගැන්විය යුතුය.

***නියෝජ්‍යායතන ප්‍රතිචාර***

***ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිචාරය :-***

කඳුරට සංවර්ධන බැංකුවේ (දැනට ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ) ක්ෂේත්‍ර නිලධාරීන් විසින් යෝජනා ක්‍රමය ජනප්‍රිය කිරීමට හා එම යෝජනා ක්‍රමය යටතේ වැඩි පහසුකම් සැපයීමට විශාල පරිශ්‍රමයක් දැරූ බව ශ්‍රී ලංකා මහ බැංකුව ද නිරීක්ෂණය කර තිබුණි.

### *3.2.4 ලංකා බැංකුව*

ලංකා බැංකුව විසින් ණය කටයුතු සඳහා රක්ෂණ ආවරණ ලබා ගැනීමට කෘෂිකර්ම හා කෘෂි රක්ෂණ මණ්ඩලය සමග අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. එසේවුවත්, රක්ෂකයා විසින් මියගිය සතුන් සඳහා රක්ෂණ වන්දි ගෙවා නොතිබීම නිසා ණය වාරික ගෙවීමේදී ණය ගැණුම්කරුවන් අපහසුතා වලට මුහුණ දුන් බවට ඔවුන් පැමිණිලි කර තිබුණි.

දෙනුන් මිළදී ගැනීම සඳහා ණය අනුමත කිරීමේදී පවතින ගවගාල් පිළිබඳව සලකා නොතිබුණි.

නාරම්මල හා වීරඹුගෙදර ප්‍රදේශවල සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂණවලින් බොහෝ ගවගාල් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අනුමත ප්‍රමිතීන් වලට අනුකූල වී නොතිබුණු බව අනාවරණය විය.

ලංකා බැංකුවේ තඹුත්තේගම ශාඛාව විසින් නවගත්තේගම විසූ ණය ගැණුම්කරුවන්ට පමණක් ණය ලබා දී තිබුණි.

ණය ප්‍රදානය කිරීම හා හිඟ මුදල් අය කිරීම සම්බන්ධයෙන් ලංකා බැංකුවේ එප්පාවල ශාඛාව සාර්ථක වී තිබුණි. එප්පාවල කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතියේ සාමාජිකයන් වෙත ප්‍රදානය කර තිබුණු ණය, සමිතිය හරහා සාර්ථකව අය කරගෙන තිබුණි.

සමාලෝචිත වර්ෂය තුලදී ලංකා බැංකුවේ ගම්පහ දිස්ත්‍රික්කයේ ශාඛා කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ කිසිදු ණයක් ප්‍රදානය කර නොතිබුණි.

***බලපෑම***

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ දී කිරි නිපදවන්නන්ගේ සමිතිවල දායකත්වය විශේෂිත වශයෙන් වාසිදායක විය. දිස්ත්‍රික්කයේ පිහිටි ලංකා බැංකුවේ ශාඛා එම සමිති හරහා ණය ප්‍රදානය කර, වාරික අයකර තිබුණි.

(ආ) රක්ෂණ වන්දි ලැබීම ප්‍රමාදවීම හේතුවෙන් ණය ගැණුම්කරුවෝ අතෘප්තිමත්ව හා අධෛර්යයට පත්ව සිටියහ.

(ඇ) සමහර ලංකා බැංකු ශාඛා විසින් මන්දගාමී ප්‍රගතියක් පෙන්වා තිබුණි.

***නිර්දේශ***

(අ) කිරි එකතු කිරීමේ සමිති / කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති හරහා ණය අධීක්ෂණය හා වාරික අයකර ගැනීම ඉතා ඵලදායී වන හෙයින් ඒ හරහා කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ණය ගැණුම්කරුවන්ට ණය ප්‍රදානය කිරීමට ලංකා බැංකුවේ ශාඛාවන් තවදුරටත් දිරිගැන්විය යුතුය.

(ආ) ණය ගැණුම්කරුවන්ගේ නීත්‍යානුකුල ඉල්ලීම් වලට ගරු කිරීමට රක්ෂකයාට නොහැකිවීම කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගැනීමේදී ගොවීන් අධෛර්යමත් කරනු ලැබූ සාධකයක් වූ බැවින් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සමඟ එළඹී අවබෝධතා ගිවිසුමේ කොන්දේසි සංශෝධනය කිරීම සලකා බැලීම ණය ගැණුම්කරුවන්ට ප්‍රයෝජනවත් විය හැකිය.

***නියෝජ්‍යායතන ප්‍රතිචාර***

***ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිචාරය :-***

ලංකා බැංකුවේ ශාඛාවල කාර්යසාධනය සතුටුදායක වූ අතර කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ශාඛා මට්ටමෙන් තවදුරටත් දිරි ගැන්වීම් අවශ්‍ය වේ. (ආ) නිර්දේශය පිළිගනු ලබයි.

### *3.2.5 මහජන බැංකුව*

මහජන බැංකුව විසින් ප්‍රදානය කල ණය සඳහා රක්ෂණ ආවරණ ලබා ගැනීමට කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. කෙසේ වෙතත්, මියගිය සතුන් වෙනුවෙන් රක්ෂණ මුදල් ලැබී නොතිබුණු බවට ණය ගැණුම්කරුවන් බොහෝ දෙනෙක් පැමිණිලි කර තිබුණු අතර ණය වාරික ගෙවීමේදී ඔවුන් දුෂ්කරතා වලට මුහුණ පා තිබුණි.

සමහර ශාඛා තම මෙහෙයුම් කලාපය තුළ කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය පුළුල් කිරීමට ඵලදායී උත්සාහයක් ගෙන නොතිබුණි. නාරම්මල ශාඛාව එක් ණයකට පමණක් සීමාවීම උදාහරණයක් වශයෙන් දැක්විය හැකිය. දවුලගල ශාඛාවේ ණය ගැණුම්කරුවන් හත් දෙනෙකුගෙන් ණය සඳහා සියයට 12 ක පොලිය වෙනුවට සියයට 14ක පොලියක් අයකර තිබුණු බව නිරීක්ෂණය විය. ණය පොලිය සියයට 8 දක්වා වෙනස් කර තිබුණු නමුත් මහජන බැංකුවේ ප්‍රධාන කාර්යාලය විසින් ශාඛා කළමනාකරුවන් වෙත අපැහැදිලි උපදෙස් නිකුත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් එම පොලී අනුපාත ශාඛා විසින් යොදා ගෙන නොතිබුණි.

මහජන බැංකුව, ගම්පහ දිස්ත්‍රික්කයේ කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය මෑතකදී ආරම්භ කර තිබුණු අතර 2010 ඔක්තෝබර් මාසයේදී මීරිගම ශාඛාව හත් දෙනෙක් සඳහා ණය ප්‍රදානය කිරීමට මුදල් වැයකර තිබුණි.

***බලපෑම***

(අ) රක්ෂකයා විසින් රක්ෂණ වන්දි පියවීම ප්‍රමාදවීම හේතුවෙන් ණය ගැණුම්කරුවන් අසතුටට හා අධෛර්යයට පත්ව සිටියහ.

(ආ) කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ කටයුතු සඳහා ණය ප්‍රදානය කිරීමේදී මහජන බැංකුවේ සමහර ශාඛා මන්දගාමී ප්‍රගතියක් පෙන්වා තිබුණි.

***නිර්දේශ***

(අ) ණය ගැණුම්කරුවන්ගේ නීත්‍යානුකූල ඉල්ලීම් වලට ගරු කිරීමට රක්ෂකයාට නොහැකිවීම, කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගැනීමේදී ගොවීන් අධෛර්යයමත් කරනු ලබන සාධකයක් වූ බැවින් කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සමඟ එලඹී අවබෝධතා ගිවිසුමේ කොන්දේසි සංශෝධනය කිරීමට සලකා බැලීම ණය ගැණුම්කරුවන්ට ප්‍රයෝජනවත් විය හැකිය.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් අනුව සියයට 8 තෙක් පොලී අනුපාතය සශෝධනය කිරීමට මහජන බැංකුව ඉක්මන් පියවර ගත යුතුය.

***නියෝජිතායතන ප්‍රතිචාර***

***ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිචාරය:-***

නිර්දේශය (අ) පිළිගන්නා අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස් ප්‍රකාර ඉහත නිර්දේශය (ආ) යටතේ සඳහන් අදාල පොලී අනුපාතය යොදාගන්නා ලෙස මහජන බැංකුව දැනටමත් උපදෙස් නිකුත් කර තිබුණි.

## *3.3 අධීක්ෂණ නියෝජිතායතනවල කටයුතු පිළිබඳ නිරීක්ෂණ*

### *3.3.1 මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය*

කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් 17 ඡේදය අනුව සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත කලට වේලාවට පොලී සහනාධාර ගෙවීම මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යය වේ. ඉකුත් අර්ධ වර්ෂ හතර තුළ පොලී සහනාධාර ගෙවූ දිනයන් හා ගෙවීම් විස්තර පහත දැක්වේ.

| **කාලය** | **පොලී සහනාධාර මුදල රු.** | **ගෙවූ දිනය** |
|---|---|---|
| 2008 දෙසැම්බර් 31 දිනෙන් අවසන් අර්ධ වර්ෂය | 1,385,150 | 2009 සැප්තැම්බර් 17 |
| 2009 ජූනි 30 දිනෙන් අවසන් අර්ධ වර්ෂය | 10,174,178 | 2010 පෙබරවාරි 18 |
| 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් අර්ධ වර්ෂය | 17,352,353 | 2010 ජූලි 23 |
| 2010 ජූනි 30 දිනෙන් අවසන් අර්ධ වර්ෂය | තීරණය කර නොමැත | ගෙවා නැත. |

ඊට අමතරව කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රම අධීක්ෂණ ක්‍රියාවලියේ කොටසක් වශයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණ කිසිවක් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් සිදුකර නොතිබුණි.

***බලපෑම***

(අ) පොලී පිරිවැය ප්‍රතිපූර්ණය කිරීමේ ප්‍රමාදය හේතුවෙන් කුඩා පරිමාණ සහභාගිත්ව මූල්‍ය ආයතන අධෛර්යයට පත්විය හැකිය.

(ආ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ නිලධාරීන් අවම වශයෙන් අහඹු ලෙස ක්ෂේත්‍ර පරීක්ෂණ වල නොයෙදෙන්නේනම්, කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ සත්‍ය ප්‍රගතිය තක්සේරු කිරීමට නොහැකිවනු ඇත.

***නිර්දේශය***

(අ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ ණය ලියාපදිංචි කිරීම හා ඒ මත පොලී සහනාධාරය ප්‍රතිපූර්ණය කිරීම කඩිනම් කළ යුතුය.

(ආ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ නිලධාරීන් ක්ෂේත්‍ර පරීක්ෂණවල නියැලීම.

***නියෝජිතායතන ප්‍රතිචාර***

***මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ප්‍රතිචාරය :-***

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පොලී සහනාධාරය ගණනය කරනු ලබන අතර සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉල්ලීම් පදනම් කර ගෙන ගෙවීම් කරනු ලබයි. ඒ අනුව, ආරම්භයේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉල්ලීම් ලැබුණු දිනෙන් පසු මාසයක සිට මාස තුනක කාලයක් ගෙවීම් පියවීමට ගතවිය. සහනාධාර ගෙවීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට ගෙන තිබුණු පියවර හේතුවෙන් සාමාන්‍යයෙන් එක් මාසයක් තුළ ගෙවීම් කර තිබුණි.

තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉල්ලීම් සකස් කිරීමට ගෙන තිබුණු කාලයද මාස අටක සිට දළ වශයෙන් මාස තුනක් දක්වා අඩු වී තිබුණි. මුදල් ප්‍රවාහයේ ගැටළු හේතුවෙන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ප්‍රමුඛතා පදනමක් මත අරමුදල් නිදහස් කරනු ලබන හෙයින් හා ඉල්ලීම් සකස් කිරීමේ හා ඒ මත ගෙවීම් කිරීමේ නොවැලැක්විය හැකි සමස්ථ ප්‍රමාදය හේතුවෙන් තවදුරටත් මෙම ගෙවීම් සිදු කිරීම කඩිනම් කිරීමට නොහැකි වී තිබුණි. අත්‍යවශ්‍ය වූ විට සහභාගිත්ව මූල්‍ය ආයතනවල අනුග්‍රහයෙන් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකර තිබුණි. කෙසේවෙතත්, මූල්‍ය, කාලය හා මානව ප්‍රාග්ධන සීමාවන් හේතුවෙන් සමස්ත ව්‍යාපෘති කලාපය ආවරණය කිරීමට ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කිරීමට අපට නොහැකි වී තිබුණි.

### ***3.3.2 පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය***

පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය සඳහා තාක්ෂණික සහයෝගය සැපයීමට ශ්‍රී ලංකා මහ බැංකුව සමග එකඟ වී තිබුණු නමුත් බිම් මට්ටමේ පශු සම්පත් සංවර්ධන කටයුතු වලට සම්බන්ධවන පශු වෛද්‍යවරුන් හා පශු සම්පත් සංවර්ධන නිලධාරීන් සෘජුව පාලනය කරනු ලැබ තිබුණේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා පළාත් සභා විසිනි. ඒ අනුව, එම ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලැබූ විවිධ සංවර්ධන ව්‍යාපෘති වලට

සම්බන්ධවන නිලධාරීන් මෙම ආයතන ත්‍රිත්වය විසින් නිකුත් කරනු ලැබූ උපදෙස් පිළිපැදිය යුතුවිය. ඒ අනුව, ණය මුදල් මගින් මිළට ගැනීමට බලාපොරොත්තු වූ දෙනුන් සඳහා අවශ්‍ය වන සෞඛ්‍ය සම්පන්න බව තහවුරු කිරීම සඳහා නිලධාරීන් විසින් අඩු අවධානයක් යොමු කර තිබුණි.

ගම්පහ දිස්ත්‍රික්කයේ හැර සෙසු ප්‍රදේශවල කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ කටයුතු සඳහා පශු සම්පත් සංවර්ධන නිලධාරීන් ප්‍රමාණවත් දායකත්වයක් සපයා නොතිබුණු බව අනාවරණය විය. ක්ෂේත්‍ර පරීක්ෂණවලදී සම්මුඛ සාකච්ඡාවලට භාජනය කරනු ලැබූ කුරුණෑගල, අනුරාධපුරය සහ මහනුවර දිස්ත්‍රික්කවල ගොවීන් 60 දෙනෙකුගෙන් ගොවීන් 49 ප්‍රකාශ කර තිබුණේ කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය අධීක්ෂණ කටයුතු සඳහා පශු සම්පත් සංවර්ධන නිලධාරීන් තමන්ගේ පරිශ්‍රයන් වෙත නොපැමිණෙන බවය. පශු සම්පත් සංවර්ධන නිලධාරීන්ගේ පැහැදිලි කිරීම් අනුව ඔවුන්ගේ මෙහෙයුම් කලාප ඉතා විශාල බවත්, ඒ හේතුවෙන් හදිසි කැඳවීම් වලට පැමිණීමට හෝ කිරි ගොවීන්ගේ පරිශ්‍රයන් වෙත නිරන්තරයෙන් පැමිණීම දුෂ්කර වී තිබුණි.

කිරි ගොවීන් විසින් පල කරන ලද අදහස් අනුව, කෘතිම සිංචන කටයුතු සඳහා පශු සම්පත් සංවර්ධන නිලධාරීන් ගොවිපලවල් වෙත යාමට එක් ගමනක් සඳහා රු.300 ක සැතපුම් ගාස්තුවක් අය කරනු ලබයි. සාර්ථක කෘතිම සිංචන ප්‍රතිකාරයක් සඳහා උත්සාහයන් කිහිපයක් අවශ්‍ය වන අතර එම පිරිවැය ගොවීන්ට අමතර වැයබරක් වේ. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව, පශු සම්පත් සංවර්ධන නිලධාරීන්ට ගොවීන්ගෙන් සැතපුම් කුලිය අයකර ගැනීමට අවසර දී තිබුණි.

**බලපෑම**

(අ) සමහර ප්‍රදේශවල කිරි ගොවීන්ගේ ගොවි කටයුතු පිළිබඳ පුරුදු වෙනස් වී නොතිබුණු බව නිරීක්ෂණය විය. සම්මුඛ පරීක්ෂණයට භාජනය කළ කිරි ගොවීන් 67 දෙනෙකු අතරින් ගොවීන් 60 දෙනෙකු ඔවුන්ගේ ගොවිපල කටයුතු ප්‍රමාණවත් තාක්ෂණික පසුබිමක් රහිතව සිදුකරන බව ප්‍රකාශ කරනු ලැබූ බව ක්ෂේත්‍ර පරීක්ෂාවන් වලදී අනාවරණය විය. ඒ අනුව දේශීය කිරි ගොවීන් වෙත සමාන ලෙස තාක්ෂණික දැනුම මාරු වී නොතිබුණි. උදාහරණ වශයෙන් වියළි කලාපයේ ජීවත් වන ගොවීන්, කිරි දෙනුන් ගවගාල තුල රඳවා කෑම ලබාදීමට හුරුවී නොතිබුණි. ව්‍යාප්ති සේවා කටයුතු වල නිරත නිලධාරීන්, ඉහළ එලදාවක් සඳහා දෙනුන් ගවගාල තුල රඳවා කෑම ලබාදීමේ ප්‍රයෝජන පිළිබඳව දැනුවත් කිරීමට ප්‍රමාණවත් ලෙස පියවර ගෙන නොතිබුණි. කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ කටයුතු සිදු කිරීමට උපදෙස් ලබාදීමේ ක්‍රමෝපායන් ව්‍යාප්ති නිලධාරීන් වෙත තිබිය යුතුය.

(ආ) පශු සම්පත් සංවර්ධන යෝජනා ක්‍රමයේ සාර්ථකත්වය සඳහා කිරි පට්ටි පාලනය සම්බන්ධ බිම් මට්ටමේ ව්‍යාප්ති සේවාවන් පැවැත්වීම අත්‍යවශ්‍ය සාධනයක් විය. පර්පාලන ගැටලු සහ ව්‍යාප්ති සේවා කටයුතු සඳහා මානව සම්පත් හිඟවීම හේතුවෙන් කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ කටයුතු පිළිබඳව පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ වූ ආයතන විසින් ව්‍යාප්ති සේවා සඳහා වැඩි අවධානයක් යොමු කර නොතිබුණි. කෙසේ වෙතත්

කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ කටයුතු සම්බන්ධයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ ව්‍යාප්ති නිලධාරීන්ගේ දායකත්වය විශේෂිත වශයෙන් සුබදායී විය.

(ඇ) කිරි ගොවීන් වෙත හොඳ ව්‍යාප්ති සේවා ලබාදීමට හැකිවන පරිදි එක් එක් නිලධාරීන්ගේ මෙහෙයුම් ප්‍රදේශය සාධාරණ ලෙස තීරණය කල යුතුය.

**නිර්දේශය**

(අ) පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, යටත් ආයතනවල සංවිධාන ව්‍යුහය හා බිම් මට්ටමේ ක්‍රියාකාරී නිලධාරීන්ට උපදෙස් ලබාදීමේ ප්‍රවාහය පිළිබඳව පියවර ගැනීමට නැවත සලකා බැලිය යුතුය.

(ආ) කිරි ගොවීන් වෙත අමතර බරක් වන හෙයින් කිරි ගොවීන්ගේ හදිසි කැඳවීම් සඳහා පශු සම්පත් සංවර්ධන නිලධාරීන් විසින් අය කරනු ලබන සැතපුම් ගාස්තුව තීරණය කිරීමට පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය පියවර ගත යුතුය.

**නියෝජිතායතන ප්‍රතිචාර :-**

පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිචාරය ලැබී නොතිබුණි.

### *3.3.3 ශ්‍රී ලංකා මහ බැංකුව*

ශ්‍රී ලංකා මහ බැංකුව, පශු සම්පත් සංවර්ධන කටයුතුවල ක්‍රියාකාරීව සම්බන්ධ වී සිටින පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යාපෘති නිලධාරීන් වෙත දිරිගැන්වීමේ ගෙවීම් කිරීමට වර්ෂ දෙකක කාලයක් සඳහා ප්‍රතිපත්ති ප්‍රෝත්සාහක අරමුදලක් පිහිටුවා තිබුණි. ප්‍රතිපත්ති ප්‍රෝත්සාහක අරමුදල යටතේ පශු සම්පත් සංවර්ධන නිලධාරීන්ට දිරිගැන්වීමේ ගෙවීම් කිරීමට හඳුන්වාදුන් ප්‍රධාන නිර්නායකයන්ගෙන් එකක් වන්නේ ණය පහසුකම් ලබා ගැනීම සඳහා සහභාගිත්ව මූල්‍ය ආයතනයකට ගොවීන් හඳුන්වාදීමය. කෙසේ වෙතත්, කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ කටයුතු වල කාර්යසාධනය සඳහා 2009 වර්ෂයේදී දිරිගැන්වීම් ප්‍රදානය කරන ලද පශු සම්පත් සංවර්ධන නිලධාරීන් 84 දෙනෙකුගෙන් 61 දෙනෙකු සහභාගිත්ව මූල්‍ය ආයතන ශාඛාවලට කිසිදු ගොවියෙකු හඳුන්වා දී නොතිබුණි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දුන් මෙහෙයුම් උපදෙස් අනුව, ගොවීන්ට ණය මුදල් මුදා හැරීමට පෙර ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ එම ණය ලියාපදිංචි කල යුතුය. කෙසේවෙතත්, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ ප්‍රගති වාර්තා අනුව ලියාපදිංචි කල ණය සංඛ්‍යාවට වඩා අරමුදල් වියදම් කළ ණය සංඛ්‍යාව වැඩි වීමෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි කිරීමෙන් තොරව ණය මුදල් ගෙවා තිබුණු බව පෙනී ගොස් තිබුණි. ලබාගත් තොරතුරු අනුව සහභාගිත්ව මූල්‍ය ආයතන මුදල් ගෙවීමෙන් අනතුරුව අදාල ණය ශ්‍රී ලංකා මහ බැංකුවේ කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය වශයෙන් ලියාපදිංචි කර තිබුණි.

කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ කටයුතුවල සාර්ථකත්වය සඳහා සමහර සංවර්ධන බැංකු විසින් සේවා නියුක්ත කර තිබුණු ක්ෂේත්‍ර නිලධාරීන් සේවා ප්‍රදේශවල, විශේෂයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කය තුල, ධනාත්මක දායකත්වයක් සපයා තිබුණි. එම ක්ෂේත්‍ර නිලධාරීන් නිරන්තරව ගොවීන් මුණ ගැසී කිරි ගොවිපල පාලනය හා බැංකු සමග සම්බන්ධතා අඛණ්ඩව පැවැත්වීම සම්බන්ධයෙන් ඔවුන් දිරි ගන්වා තිබුණු බව ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

***බලපෑම***

(අ) ව්‍යාපෘති නිලධාරීන් දිරිගැන්වීමට දීමනා ලබාදීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිහිටුවා තිබුණු ප්‍රතිපත්ති ප්‍රෝත්සාහක අරමුදල, කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය කටයුතු වර්ධනය කිරීමට සමස්තයක් වශයෙන් ඵලදායී කාර්යයක් වී නොතිබුණි.

(ආ) කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය හා සමාන ක්ෂුද්‍ර මූල්‍ය කටයුතුවල සාර්ථකත්වය සඳහා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සේවය අත්‍යවශ්‍ය සාධකයක් වන අතර, ඒ අනුව ඔවුන්ට ප්‍රතිලාභ ලබාදීමට නිසි ක්‍රමවේදයක් පිහිටුවා නොතිබීම හේතුවෙන් යෝජනා ක්‍රමයේ දුර්වල කාර්යසාධනය නිරූපණය විය.

(ඇ) සහභාගිත්ව මූල්‍ය ආයතන කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කල ණය ලියාපදිංචි නොකල හොත්, ඉන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය ඵලදායී නොවුණි.

***නිර්දේශ***

(අ) ප්‍රතිලාභ යෝජනා ක්‍රමය, සහභාගිත්ව මූල්‍ය ආයතනවල ක්ෂේත්‍ර නිලධාරීන් වෙතටද දීර්ඝ කළයුතු අතර නිර්නායක සම්පූර්ණ කළ විටක පමණක් ප්‍රතිලාභ ලැබෙන බව තහවුරු කිරීමට හැකිවන පරිදි පාලනය කළ යුතුය.

(ආ) සහභාගිත්ව මූල්‍ය ආයතන උපදේශවලට අනුකූලව කටයුතු කරන බව හා කළයුතු අතර කෘෂි - පශු සම්පත් යෝජනා ක්‍රමය යටතේ ණය මුදා හැරීමට පෙර මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයෙන් පොළී සහනාධාරය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබා ගැනීමට හැකිවන පරිදි ණය ලියාපදිංචි කරන බව තහවුරු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කල යුතුය.

**නියෝජිතායතන ප්‍රතිචාර :-**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉහත නිර්දේශයන් සඳහා ප්‍රතිචාර දක්වා නොමැත.

# 4. නිගමනය

කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය, 2008 අයවැය යටතේ යෝජනා කරන ලද ප්‍රධාන වැඩසටහනක් වන අතර එය දේශීය කිරි නිෂ්පාදනය වර්ධනය කිරීමට රාජ්‍ය හා පෞද්ගලික අංශයේ විවිධ ආයතනවල සහභාගිත්වයෙන් ක්‍රියාත්මක විය. වැඩි රැකියා ප්‍රමාණයක් සැපයීමට හා කිරිපිටි ආනයනය සඳහා වැය කරනු ලබන විදේශ විනිමය ඉතිරි කර ගැනීමට හැකිවන පරිදි රටේ දියර කිරි නිෂ්පාදනය වැඩි කිරීමේ අරමුණින් මෙම වැඩසටහන සඳහා රජය රු.මිලියන 5,000 ක් වෙන්කර තිබුණි.

කෙසේවෙතත්, වෙනත් ආයතන විසින් ජාතික හා ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාත්මක කළ සමගාමී ව්‍යාපෘති හේතුවෙන් රටේ දියර කිරි නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් වූ බලපෑම විගණනයේදී නිසි පරිදි තීරණය කළ නොහැකි විය.

සමහර සහභාගිත්ව ණය දෙන ආයතන විසින් සමහර දිස්ත්‍රික්කවල කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය නිසි ලෙස ක්‍රියාත්මක කර තිබුණු බවත්, වෙනත් සහභාගිත්ව ණය දෙන ආයතන විසින් කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ අරමුණු වෙනත් දිස්ත්‍රික්ක වලදී ඉටුකර ගෙන නොතිබුණු බවත් වැඩි දුරටත් නිරීක්ෂණය විය. ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල ගොවීන් විසින් මුහුණ දෙන ගැටලු නිසි පරිදි විසඳීමට හැකිවන පරිදි ඒවා ආරම්භක අවස්ථාවේදීම හඳුනාගෙන නොතිබුණි. සමහර සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් සේවා නියුක්ත කර තිබුණු බිම් මට්ටමේ නිලධාරීන් සිය කටයුතු හොඳින් ඉටුකර තිබුණු අතර සතුටුදායක ලෙස ඉලක්ක සපුරාගෙන තිබුණි.

නිගමනයක් වශයෙන්, ප්‍රාදේශීය මට්ටමේ සත්‍ය ගැටලු හඳුනා ගැනීමට හා කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ නියුක්ත නිලධාරීන්ගේ අත්දැකීම් හුවමාරු කිරීමට වැඩි අවස්ථාවක් සලසා දෙමින් පශු සම්පත් ක්ෂේත්‍රයේ සියළු ආයතන සම්බන්ධීකරණය කිරීමට නිසි ක්‍රමවේදයක් පිහිටුවිය යුතුය. තවද, ඉලක්ක සපුරා ගැනීම සඳහා වැඩි මූල්‍ය ප්‍රතිලාභ සලසමින් විවිධ ආයතනවල බිම් මට්ටමේ කටයුතු කරන නිලධාරීන් දිරිගැන්විය යුතුය.

***කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය පිළිබඳව***

**1 කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ අරමුණු,**

(අ) කිරි ගවයන්, කෘෂිකාර්මික හා ශීත කිරීමේ උපකරණ, සේවා මිළදී ගැනීමට සහ ගවගාල් ඉදිකිරීම සඳහා කුඩා ගොවීන් වෙත පහසුකම් සැපයීමට හා ඔවුන්ගේ ආදායම වර්ධනය කිරීම සඳහා කෘෂිකාර්මික ණය වැඩසටහන් නිර්මාණය කිරීම.

(ආ) කෘෂිකාර්මික හා සම්බන්ධිත සේවාවල නිරත පෞද්ගලික අංශයේ ආයෝජකයින්ට සහායවීම.

(ඇ) කෘෂිකාර්මික හා සම්බන්ධිත ක්ෂේත්‍රවල නව සේවා නියුක්ති අවස්ථා උත්පාදනය කිරීම.

(ඈ) කෘෂිකාර්මික හා පශු සම්පත් සංවර්ධන කටයුතු සඳහා මධ්‍යකාලීන ණය ප්‍රදානය කිරීම.

(ඉ) කුඩා ගොවීන්ට, නව තාක්ෂණික ක්‍රමවේද හා වෙළඳපල අවස්ථා වලට මාරුවීමට මාර්ග විවෘත කිරීම.

(ඊ) යැපුම් මට්ටමේ සිට ව්‍යාපාරික මට්ටම දක්වා කුඩා ගොවීන්ට මාරුවීමට අවස්ථා සැලසීම.

(උ) සමස්ථයක් ලෙස කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඵලදායිතාවය වර්ධනය කිරීම.

***1.2 සහභාගිත්ව ආයතන හා ඒවායේ වගකීම්***

සහභාගිත්ව ආයතන වල ප්‍රධාන වගකීම් පහත දැක්වේ.

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය, පොලී සහනාධාර යෝජනා ක්‍රමය හා ප්‍රතිපත්ති ප්‍රොත්සාහක අරමුදල ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය.

(ආ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව
කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ හා පොලී සහනාධාර ක්‍රමයේ ප්‍රගතිය සමාලෝචනය කිරීම හා මෙහෙයවීම සහ පොලී සහනාධාර ගෙවීමට ප්‍රමාණවත් අයවැය ගත ප්‍රතිපාදනයක් සැලසීම.

(ඇ) පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
ගොවීන්ට හා කෘෂි - පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයට සම්බන්ධවන සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත තාක්ෂණික සහයෝගය සැපයීම.

(ඇ) සහභාගිත්ව මූල්‍ය ආයතන - ප්‍රධාන කාර්යාල
ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු යටතේ යෝජනා ක්‍රමයේ සියලුම කටයුතු පරිපාලනය කිරීම.

ඉලක්කගත ප්‍රතිලාභීන් තෝරා ගැනීම, ණය මුදල් ගෙවීම සහ ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය සහභාගිත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාල වෙත වාර්තා කිරීම.

කෘෂි හා පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් සහභාගිත්ව මූල්‍ය ආයතන, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තෝරා ගෙන තිබුණි.
ලංකා බැංකුව
මහජන බැංකුව
හැටන් නැෂනල් බැංකුව
ලංකා වාණිජ බැංකුව
සම්පත් බැංකුව
ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව
සණස සංවර්ධන බැංකුව
ඌව සංවර්ධන බැංකුව *
රුහුණු සංවර්ධන බැංකුව *
වයඹ සංවර්ධන බැංකුව *
කඳුරට සංවර්ධන බැංකුව *
රජරට සංවර්ධන බැංකුව *
සබරගමුව සංවර්ධන බැංකුව *

* මෙම බැංකු, 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ 2010 ජූලි 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ලෙස ඒකාබද්ධ කර තිබුණි.

### *1.3 ඉලක්ක*

වර්ෂ තුනක කාලයක් තුළ රු.මිලියන 5000 ක් වටිනා ණය මුදල් ගෙවීමටත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සියයට 5ක පොලී සහනාධාර ප්‍රතිපාදනය කිරීමටත් අපේක්ෂිත විය.

විගණනය පිළිබඳ වැඩිමනත් තොරතුරු

## 1. ක්ෂේත්‍ර පරීක්ෂණ

කෘෂි හා පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ, පහළ මට්ටමේ ප්‍රතිලාභීන් විසින් ලබාගත් බව තහවුරු කිරීමට විගණන කණ්ඩායම විසින් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කරන ලදී. ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීමට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය සහ සහභාගිත්ව මූල්‍ය ආයතනවල නිලධාරීන් සමග සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී. සහභාගිත්ව මූල්‍ය ආයතනවල ඒකාබද්ධ ශාඛා වලින් ලබාගත් තොරතුරු පදනම් කර ගෙන, විගණන කණ්ඩායමේ සාමාජිකයින් කුරුණෑගල, මහනුවර, ගම්පහ සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ගව ගොවිපළවල් 67 ක් අධීක්ෂණය කරන ලදී. කිරි ගොවීන් ගෙන් හා සහභාගිත්ව මූල්‍ය ආයතන වලින් තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලියක් උපයෝගී කර ගන්නා ලදී.

## 2. ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා නියැදිය තෝරා ගැනීම

කෘෂි හා පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභීන්ගේ සංගහනය අතුරින් තෝරා ගත් නියැදියක් පදනම් කර ගෙන ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කරන ලදී. නියැදිය තෝරා ගැනීමේදී පහත සඳහන් සාධක සැලකිල්ලට ගන්නා ලදී.

(අ) දිවයිනේ කෘෂි දේශගුණික තත්ත්වය අනුව ශ්‍රී ලංකාවේ කෘෂි - පශු සම්පත් කටයුතු වෙනස් වේ. ඒ අනුව පහත රට, තෙත් කලාපය, වියළි කලාපය හා පොල් ත්‍රිකෝණ කලාපය යනාදී කෘෂි දේශගුණික කලාපවල පිහිටි දිස්ත්‍රික්ක අනුව තෝරා ගැනීම් සිදු කරන ලදී. තවද කෘෂි - පශු සම්පත් සංවර්ධන යෝජනා ක්‍රමය ආරම්භයේ සිටම එය ක්‍රියාත්මක කළ දිස්ත්‍රික්කයන්ද ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා තෝරා ගැනීමට සලකා බලන ලදී.

(ආ) ණය ලියාපදිංචි කිරීම හා ප්‍රදානය කිරීම වැඩි සංඛ්‍යාවක් සිදුකළ සහභාගිත්ව මූල්‍ය ආයතනද නියැදිය සඳහා තෝරා ගන්නා ලදී. කෙසේ වෙතත්, වෙනත් සහභාගිත්ව මූල්‍ය ආයතන වලට වඩා රජය සතු සහභාගිත්ව මූල්‍ය ආයතන ණය විශාල සංඛ්‍යාවක් ප්‍රදානය කර තිබුණි.

(ඇ) කෘෂි - පශු සම්පත් සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කළ ණය සංඛ්‍යාව මත තෝරාගත් දිස්ත්‍රික්කවල පිහිටි සහභාගිත්ව මූල්‍ය ආයතනවල ශාඛාවන් තෝරා ගන්නා ලදී. ඉහළම ණය සංඛ්‍යාවක් ප්‍රදානය කර තිබුණු ශාඛාවන් වලට ප්‍රමුඛත්වය ලබා දෙන ලදී.

(ඈ) අදාල සහභාගිත්ව මූල්‍ය ආයතනවල ශාඛා විසින් නඩත්තු කරන ලද ණය ලිපි ගොනු පරීක්ෂා කිරීමෙන් සම්මුඛ පරීක්ෂණ සඳහා ගතයුතු ගොවීන් තෝරා ගන්නා ලදී. එම ගොවීන්ගේ ගොවිපලවල් විගණන කණ්ඩායම විසින් භෞතිකව පරීක්ෂා කරන ලදී.

(ඉ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති ප්‍රොත්සාහක අරමුදල යටතේ දිරි දීමනා ප්‍රදානය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබාගත් තොරතුරු පදනම් කර ගෙන සම්මුඛ පරීක්ෂණ සඳහා පශු සංවර්ධන නිලධාරීන් තෝරා ගෙන තිබුණි.

**කාර්යසාධන විගණනය සිදුකිරීමේදී සීමාවන්**

පාඨකයන්ගේ සහ ඉදිරිපත් කළ නිර්දේශ සඳහා ප්‍රතිචාර අපේක්ෂා කරනු ලබන ආයතනවල ප්‍රයෝජන සඳහා මෙම කාර්යසාධන විගණනයේ පහත සඳහන් සීමාවන් ඉදිරිපත් කරනු ලැබේ.

(අ) කෘෂි - පශු සම්පත් සංවර්ධන යෝජනා ක්‍රමයේ කටයුතු ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය සඳහා විවිධ අදියරයන් වලදී මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව හා සහභාගිත්ව මූල්‍ය ආයතන වැනි ආයතන කිහිපයක් සහභාගී වී තිබුණු අතර එක් එක් ආයතන විසින් ලබාදුන් සංඛ්‍යා ලේඛන හා තොරතුරු ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී රැස්කර ගත් අදාල සාක්ෂි සමග ගැලපී නොතිබුණි. ඒ අනුව තනි ආයතන විසින් සපයන ලද සංඛ්‍යා ලේඛන හා තොරතුරු සැසඳීම සඳහා අමතර කාලයක් අවශ්‍යව තිබුණි.

(ආ) ක්ෂේත්‍ර පරීක්ෂණවලදී සතුන් හඳුනා ගැනීමට හැකිවන පරිදි ඡායාරූප, කණ ලකුණු අංකය යනාදී විස්තර සමහර සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් පවත්වනු ලබන අදාල කෘෂි හා පශු සම්පත් සංවර්ධන ණය ගොනුවල නොතිබීම හේතුවෙන් ණය අරමුදල් යොදා ගෙන ගොවීන් විසින් මිළදී ගෙන තිබුණු කිරි එළදෙනුන්/ වැස්සියන් හඳුනා ගැනීමට අපහසු විය. නිවැරදි හඳුනා ගැනීමේ කාර්යයන් සඳහා ණය ලබා ගැනීමට පෙර කිරි දෙනුන් ලියාපදිංචි කිරීමට හෝ කණ ලකුණ ලබා ගැනීමට කටයුතු කිරීමේ ක්‍රමවේදයක් ගොවීන් විසින් අනුගමනය කර නොතිබුණි.

(ඇ) ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී ගමනා ගමන දුෂ්කරතා හේතුවෙන් සමහර ණය ගැනුම් කරුවන් ඔවුන්ගේ පදිංචි ස්ථාන වලදී හමුවීමට නොහැකි වීම නිසා සමහර අවස්ථාවලදී ණය ගැනුම් කරුවන්ගේ නියැදියේ වෙනස් කිරීම් කිරීමට සිදුවිය.

(ඈ) කිරි නිෂ්පාදන ප්‍රමාණය (කිරි විකිණුම් වාර්තා) සතුන්ගේ අයිතිය මාරු කිරීම පිළිබඳ ලියකියවිලි වැනි තොරතුරු තහවුරු කිරීම සඳහා සාක්ෂි ණය ගැනුම් කරුවන්ගෙන් ලබා ගැනීමට නොහැකි විය.